# බලවතුන්ට එරෙහි වීම දඬුවම් ලැබිය හැකි වරදකි
- ගාමිණී වියන්ගොඩ (රාවය)

[2008-10-04 පසු ගිය සැප්තැම්බර් 20 වෙනි දා සුගත් නිශාන්ත ප්‍රනාන්දුට වෙඩි තබා මරා දැමී ය. මහ රැයක හෝ කිසිවෙකු සාක්ෂියට නැති තැනක හෝ නො වේ. සෙනග යන එන, මහ පාරක, මහ දවල් ය.

මීගමුව ප්‍රදේශයේ පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකුට විරුද්ධ ව

ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ඔහු විසින් මූලික අයිතිවාසිකම් පෙත්මක් ගොනු කර තිබුණි. ඒ, ඔහුට පොලිස් නිලධාරීන් පැමිණැවූ වධහිංසා සම්බන්ධයෙනි. ඊට අමතර ව, අල්ලස් චෝදනාවක් සම්බන්ධයෙන් තවත් නඩුවක් කොළඹ මහාධිකරණය ඉදිරියේ ඔහු විසින් ම පවරා තිබුණි. ඒ නඩුවත් මීගමුව

ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට විරුද්ධව යි. එ සේ තිබිය දී, ඔහු සහ ඔහුගේ පවුල විනාශ කරන බවට විවිධ පුද්ගලයන් ගෙන් තර්ජන එල්ල වූ බවට වරින් වර වාර්තා විය. එම වාර්තාවලට අනුව, ඇතැම් තර්ජන කළ අයවළුන් ඔහු විසිනුත් ඔහුගේ බිරිඳ විසිනුත් හඳුනාගෙන තිබුණි. එල්ල වෙමින් තිබූ මේ මරණීය තර්ජන ගැන වහා පියවරක් ගන්නා ලෙසත්, එ තෙක් තමාගේ ජීවිත ආරක්ෂාව සුරක්ෂිත කරන ලෙසත් ඉල්ලා, පහත සඳහන් අයවළුන් වෙත ඔහු ආයාචනා කෙළේ යඃ

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිතුමා, අග්‍රවිනිශ්චයකාරතුමා, පොලිස්පතිතුමා, ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් ඇමතිතුමා සහ එම අමාත්‍යාංශ ලේකම්වරයා, ජාතික පොලිස් කොමිසම සහ මානව හිමිකම් කොමිසම.

මේ ආයතන හෝ පුද්ගලයන් ගෙන් එක් අයෙකු හෝ ඔහුගේ ආයාචනයට කන් දී තිබුණේ නම් මේ අපරාධය වළක්වා ගත හැකි ව තිබුණි. එහෙත් ඒ කිසිවෙකු මේ සම්බන්ධයෙන් එක ඇඟිල්ලක් වත් ඔසවා තිබුණේ නැත. ඒ අනුව, අපරාධකරුවන්ට කිසි බාධාවකින් තොර ව තමන් ගේ අරමුණ ඉෂ්ට කර ගැනීමට හැකි විය. අපරාධය සිදු වීමට පෙර එම අපරාධය වළක්වා ගැනීමට රටේ නෛතික ව්‍යුහයට නො හැකි වූ ආකාරයට ම, අපරාධයෙන් පසුවත් එම අපරාධකරුවන් නීතිය ඉදිරියට පමුණුවා දඬුවම් කිරීමට එය අසමත් විය හැකි බව අතීත අත්දැකීම් ආශ්‍රයෙන් කෙනෙකු සිතා ගතහොත් අප පුදුම විය යුතු නැත. මීට අවුරුදු 4 කට ඉහත දී මීගමුව ප්‍රදේශයේ ම තවත් පුද්ගලයෙකු (ජෙරාඩ් පෙරේරා) ඝාතනය කෙරුණි. ඔහු ද පොලීසියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගිය පැමිණිලිකරුවෙකි. ඔහුගේ ඝාතනය සම්බන්ධයෙන් අද දක්වාමත් යුක්තිය ඉෂ්ට වී නැති තත්ත්වය තුළ, වර්තමාන

අපරාධකරුවන් තමන් ගේ ඉලක්කය හඹා යාම කෙරෙහි කොහෙත් ම පැකිළෙන්නට නැතුව ඇති බවට සැකයක් නැත.

නොබෙල් ත්‍යාගලාභී කොළොම්බියානු ජාතික ගබ්රියෙල් ගාර්සියා මාර්කේස් ගේ එක් ප්‍රකට නවකතාවක මාතෘකාව වන්නේ, 'කල් තියා දැනුම් දුන් මරණයක කතාන්තරයක්' යනුවෙනි. නවකතාවෙන් කියැවෙන්නේ, හේතු සම්බන්ධතා ජාලයක් විසින් නිර්මාණය කොට තිබූ මිනිස් ඝාතන අවකාශයක්, ඒ ජාලයට සම්බන්ධ සෑම පුද්ගලයෙකුට ම ඉතා පහසුවෙන් වළක්වා ගත හැකි ව තිබිය දීත් ඔවුන් ඉදිරියේ අවසානයේ එය සැබෑවක් හෙවත් නග්න යථාවක් බවට පත් වූ ආකාරය යි. ඝාතනයක් සිදු වන්නට යන බව, විශේෂයෙන් වැරදි වැටහීමක් මත අහිංසකයෙකු ඝාතනය වීමට යන බව, මුළු නුවර ම දැන සිටියේ ය. පොලිස් මුලාදෑණීන්, විනිශ්චයකාරවරුන්, නගරාධිපතිවරන් සහ පූජකතුමන්ලා ඇතුළු රජයේ සහ සිවිල් නිලධාරින් සියල්ලන් ම පාහේ මේ ඝාතනය ගැන කලින් දැනුවත් කොට තිබුණි. ඝාතනය සැලසුම් කළ මිනිමරුවන් දෙන්නා පවා, එම මිනිමැරුම වළකාලිය හැකි අවස්ථා ඕනෑ තරම් සපයා තිබුණි. කිසිවෙකු මැදිහත් වී එම මරණය වළකාලනු ඇති නම් යෙහෙකැ යි යන්න, මිනිමරුවන් ගේ පවා රහස් අපේක්ෂාව විය. එහෙත් මුළු නුවර ම බලා සිටිද්දී දෙනෝ දාහක් මැද්දේ ඝාතනය සිදු විය.

එම නවකතාව සිංහලට පරිවර්තනය කිරීමේ දී ඊට මා දුන් නම වුණේ, 'කරුමක්කාර කතාවක්' ය. අද අප අත්විඳිමින් සිටින ලංකාවේ කතාවත්, එක් අයුරකින් 'කල්තියා දැනුම් දී ඇති' කාලකණ්ණි කතාවකි. කො පමණ තරම් කල් තියා දැනුම් දී තිබුණත් එය වළකාලීමට නැවත නැවතත් අප අපොහොසත් වන නිසා, එය 'කරුමක්කාර කතාවක්' ද වන්නේ ය.

දූෂණයට සහ අත්තනෝමතිකත්වයට එරෙහිව නැගී සිටින සාමාන්‍ය පුරවැසියෙකු මරා දැමීමෙන් සමාජ සාධාරණත්වය සඳහා වන හ'ඩ නිහඬ කැරැ වීමේ මේ ප්‍රවණතාවය දැන් එම සටනේ නිරත ව සිටින නීතිවේදීන් කෙරෙහි ද ව්‍යාප්ත වෙමින් තිබේ. පසු ගිය සතියේ, ජේ. සී. වැලිඅමුණ මහතා ගේ නිවෙසට බෝම්බ ප්‍රහාරයක් එල්ල විය. වැලිඅමුණ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකි. ඊටත් වඩා, සමාජ සාධාරණත්වය වෙනුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ සක්‍රීය මැදිහත් වීමක් කළ ප්‍රධාන පෙළේ සමාජ ක්‍රියාධරයෙකි. ඔහු ට්‍රාන්ස්පැරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ (පාරදෘෂ්‍ය භාවය පිළිබඳ ජාත්‍යන්තරය) ලංකා ශාඛාවේ ප්‍රධානියා ය. මේ ආයතනය මගින් වසරක් පාසා ලෝකයේ රටවල් රාජ්‍ය දූෂණයේ මට්ටම අනුව වර්ගීකරණය කෙරේ. එය හැඳින්වෙන්නේ, ''දූෂණ අනුබෝධ ලෝක දර්ශකය'' වශයෙනි. මේ දර්ශකයට අනුව, ලංකාවට මේ වසරේ දී හිමි ව ඇත්තේ 92 වැනි ස්ථානය යි. දූෂණයෙන් පරිපූර්ණ වශයෙන් අත්මිදුණු රටකට ලැබෙන ලකුණු ප්‍රමාණය 10 කි. ඒ අනුව, ලකුණු

9.3 ක් ලබා ගනිමින් වඩාත් පිරිසුදු රාජ්‍යයන් අතර මුල් තැන සිටින්නේ, නවසීලන්තය, ඩෙන්මාර්කය සහ ස්වීඩනය යි. ලංකාව ලබා ඇත්තේ ලකුණු 3.2 ක් පමණි.

මෙම වාර්තාව ප්‍රකාශයට පත් වුණේ දනට සති දෙකකට ඉහත දී ය. ගිය සතියේ වැලිඅමුණ ගේ නිවෙසට බෝම්බ ගැසීමේ එක කොණක් මෙය විය හැක. එ සේ ම, රජයේ දූෂිත ක්‍රියාකළාපය මෙන් ම, අත්තනෝමතික ලෙස බලය අපහරණය කිරීමේ අවස්ථා ප්‍රශ්න කරමින් ඉදිරිපත් වන නීති ක්‍රියාමාර්ග ඉදිරියේ වැලිඅමුණ පෙරමුණේ සිටී. එය තවත් කොණකි. ඊටත් අමතර ව, පසු ගිය වසර තුනක කාලය තිස්සේ මේ රටේ සිදු වෙමින් පවතින මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට එරෙහි ව අධිකරණය හරහා හ'ඬක් නගන ප්‍රධාන චරිතයක් බවට වැලිඅමුණ පත් ව සිටීම තවත් කොණකි.

බලධාරීන්ට එරෙහි ව හිස ඔසවන සිවිල් පුරවැසියන් (සුගත් නිශාන්ත ප්‍රනාන්දු වැනි) කරදරයකින් තොර ව වෙඩි තබා ඝාතනය කරන අතරේ, අනිත් පැත්තෙන් එම සටන ඉහළ තලයක ගෙන යන සහ එම අරගලයේ අවශ්‍යතාවය පිළිබඳ ව රටේ පොදු මතයක් ඇති කිරීමට පෙරමුණ ගන්නා ජේ. සී. වැලිඅමුණ වැනි ප්‍රධාන පෙළේ සිවිල් ක්‍රියාධරයන්ට කල් තියා අනතුරු ඇඟවීම මේ බෝම්බ ප්‍රහාරය හරහා අපට ඉඟි කරන පාඩම යි.

ඉහත සඳහන් දූෂිත රටවල් පිළිබඳ වාර්තාවේ අවසාන රටවල් අතරට, එ නම් අන්ත දූෂිත රටවල් අතරට ගැනෙන්නේ, සුඩානය (1.6), ඇෆ්ගනිස්ථානය (1.5), හයිටිය (1.4), ඉරාකය (1.3), මියන්මාරය (1.3) සහ සෝමාලියාව (1.0) යි. මේ රටවල් අතර ඇති පොදු ලක්ෂණය කුමක් ද? දීර්ඝ කාලයක් තිස්සේ, අභ්‍යන්තර හෝ බාහිර ආරාවුල් මේ සෑම රටක ම පොදු උරුමය බවට පත්ව තිබුණ බව යි. තවත් විදිහකින් කිවහොත්, අර්බුදකාරී සමයක දී දූෂණය සඳහා විවර වන ඉඩකඩ උපරිම වන බව යි. යුදමය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ ව ඇති ලංකාව ඉතා සීග්‍රයෙන් දූෂණයට නැඹුරු වන අතරේ අනිත් පැත්තෙන් ඒ දූෂණයට එරෙහි වන්නන් දඩයම් කරන භීෂණය ද දියත් කෙරෙන දිසාවකට ගමන් කරනු ඇත.